# පුංචි මලිනි



නෙසන්සා ආවිදී කරුණාරත්න

# පුංචි මලිති

## නෙසන්සා ආවින්දි කරුණාරත්න

කතෘ

කතෘගේ වෙනත් කෘති

කුරුල්ලෝ - 2023

හොඳ යහළුවෝ දෙන්නා - 2023

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

5 ශ්‍රේණිය A

ISBN – 978-624-211-256-5

# පිදුම

මාගේ ආදරණීය ගරු මැණිවරුන්ට,

මාගේ ආරණීය දෙමාපියන්ට,

සහෝදර සහෝදරියන්ට හා

මිතුරු මිතුරියන් හට

මෙම පොත ආදරයෙන්

පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී,අභයකෝන් .එස්.
ආණ්ඩුකාරවර.ම පළාතමධ්‍ය,
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
10-05-2026

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටීසමාහිත වූ සමබර එවන් පසුබිමක සු . පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ . ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එකොමත් එක කාලෙක පුංචි ගැහැණු ළමයෙක් ජීවත් වුණා.

එයාගේ නම මලිති.

මලිතියි, මලිතිගේ යාළුවෝයි හැමදාම හවසට සෙල්ලම් කරනවා.

ඔන්න ඔහොම කාලය ගතවී ගෙන යන අතරේ වැස්ස කාලය ළඟා වුණා.

මලිතියි මලිතිගේ යහළුවොයි සෙල්ලම් කරන්න මිදුලට ගියා.



හැමෝම සතුටින් සෙල්ලම් කරමින් කාලය ගත කලා. කාටත් නොදැනීම යහළුවෝ හැමෝම සෙල්ලම් කරමින් ඈතින් ඈතට ගියා.

ඔන්න ඉතින් හදිස්සියේම වැස්ස පටන් ගත්තා.

එන්න එන්ම වැස්ස වැඩි වුණා.

ගංගා,වැව්, පොකුණු උතුරා පිටාර ගලන්න පටන් ගත්තා.

එන්න එන්නම හවස් වුණා.

ගං වතුර ගලන්න පටන් ගත්තා.

මලිත්යි මලිත්ගේ යහළුවොයි ගං වතුර සැර වැඩි නියා ගංවතුරට ගහගෙන ගියා.

මලිත්යි මලිත්ගේ යහළුවොයි කෑ ගසන්න පටන් ගත්තා.

වැස්ස සැර වැඩි නිසා කාටවත්ම කෑ ගසන ශබ්දය ඇසුනේ නෑ.



මලිතිගේ නිවස ඇතුළටත් ගංවතුර ගැලුවා. මලිතිගේ අම්මයි තාත්තයි බය වෙලා.......

“මලිති දුව තාම ගෙදර ආවේ නැහැ නේද?” තාත්තා ඇසුවා.

“දුව තාම ගෙදර ආවේ නෑ.....”

කියලා අම්මා කිවුවා.

අම්මා සහ තාත්තා කලබල උණා.

“රෑ වුනත් කමක් නෑ අපි මලිති හොයමු”

අම්මා කිවුවා........

අම්මා සහ තාත්තා වැස්සේම මලිත්ව සෙවීමට හන්හනිකට නිවසින් පිටත් වුණා.

දෙන්නම හනිහනිකට මලිත්ව හොයන්න පටන්ගත්තා....

“මලිති...... මලිති.........” කියමින් මලිතිගේ අම්මයි තාත්තයි පාරේ හැමතැනම ඇවිදගෙන ගියා.



මලිතිගේ අම්මයි තාත්තයි හැමතැනම බැලුවා.

ඒත් හොයාගන්න බැරි වුණා..........

"පාරෙන් එහා පැත්තේ ඇති ලොකු කැළෑවට ගිහින් අපි මලිතිව හොයමු...."

අම්මා කිවුවා.

"හා එහෙනම් අපි ඉක්මනින් කැළෑව පැත්තට යමු ...."

තාත්තා කිව්වා

"මලිති...... මලිති........." කියමින් ගස්වැල් අතරින් ආයමත් මලිතිව හොයන්න පටන්ගත්තා.

මලිති සහ මලිතිගේ යහළුවෝ කෑ ගහන ශබ්දය යන්තමින් ඇසුනා.....

අම්මා සහ තාත්තා ඒ ශබ්දය ඇසෙන පැත්තට වේගයෙන් දුවගෙන ගියා....

මලිති සහ යාළුවො ගසක අත්තක එල්ලී සිටිනවා තාත්තා දැක්කා....



අන්න මලිති ඉන්නවා................ කියමින් තාත්තා කෑ ගැසුවා.

තාත්තා වේගයෙන් දුවගෙන ගොස් මලිතිවයි යහළුවොයි බේරා ගත්තා....

අම්මා සහ තාත්තා මලිත්වයි මලිතිගේ යහළුවොයි පරිස්සමට ගෙදර එක්කන් ගියා..

මලිතියි මලිතිගේ යහළුවොයි සතුටින් ජීවත් වුනා..



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **හේමමාලා උපහාරv** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)